# කරුණාවන්ත මායා



ආදර්ශ්නා ගජේන්ද්‍රා

# කරුණාවන්ත මායා

ආදර්ශ්නා ගජේන්ද්‍රා

# කරුණාවන්ත මායා

## ආදර්ශ්නා ගජේන්ද්‍රා

**කතෘ**

**කතෘගේ වෙනත් කෘති**

- ගුරුතුමීට තෑග්ගක් ISBN 978-624-592-2 (15. 11.2023)
- කවිමුතුවැල් ISBN 978-624-206-593-9 (15. 11.2023)
- අත්තම්මගේ දත වැටිලා ISBN - 978-624-208-095-6 (15. 11.2023)
- මනුකට හමු වූ රාහුල පොඩි සාදු ISBN - 978-624-208-347-6
- පුංචි මගේ කවි සිතුවිලි ISBN - 978-624-208-349-0 (02. 08. 2025)
- හතේ විත්ති හතක් (15. 11.2023)
- The little seed's big adventure ISBN - 978-624-206-715-5 (15. 11.2023)
- Caterpillar's Magical Journey ISBN - 978-624-206-716-2 (15. 11.2023)
- The Little Raindrop ISBN 978-624-206-717-9 (15. 11.2023)
- Everyone Special ISBN 978-624-206-718-6 (15. 11.2023)
- The life of a chocolate cake ISBN - 978-624-208-352-0
- The Mysterious Door ISBN - 978-624-208-350-6
- Lyra ISBN - 978-624-208-351-3

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
**4 ශ්‍රේණිය B**
**2025. 02. 08**

**ISBN - 978-624-208-348-3**

# කරුණාවන්ත මායා

මෙම ග්‍රන්ථය මට කුඩා කල සිට අකුරු ඉගැන්වූ සියලුම ගුරුමෑණිවරුන්ට සහ ගුරු පියවරුන්ටත්,පාසලේ විදුහල්පතිනිය ඇතුලු ගුරු මණ්ඩලයටත්, මගේ ආදරණීය දෙමව්පියන් ඇතුලු පවුලේ සියලුම  දෙනාටත් ඉතා ආදරයෙන් සහ ගෞරවයෙන් පිළිගන්වමි.

**ආදර්ශ්නා ගජේන්ද්‍රා**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එක් කුඩා නගරයක ඉතාම වයසක හිඟන්නෙක් හිටියා. ඔහුගේ නම ජෝති. ජෝති හරිම අපිළිවෙලට ජීවත්වුණේ. ජෝතිගේ කොණ්ඩය සහ රැවුල දිගට වැවී ගැටගැසී තිබුණා. හම හොඳටම රැලි වැටිලා. ඒවගේම ඇඳුම්වල කුණු ගෑවිලා ඉරිලා තිබුණා. හරියට මුහුණ හෝදලත් නෑ. එයා ළඟ නිතරම දුගඳක් ආවා. ඒ එයාගෙ වම් කකුලේ තිබුණ ලොකු තුවාලය නිසා. ජෝති හැමදාම වීදියේ කෙළෙවරක වාඩිවී අනිත් අයගෙන් සිඟමන් ඉල්ලා සිටියා. එයාගේ ඉදිරියේ පොඩි ඉටි රෙද්දක් එලලා ඒ උඩ ටින් එකක් තියලා තිබුණා. ඒ එතනින් යන එන අයට කාසි දමන්න. ඒ වගේම එයා කෑමට යමක් ඉල්ලා සිටියා . සමහර අය එයාට සල්ලි, කෑම දුන්නා. සමහර අය ඉතාම කලබලෙන් එතනින් ගිය නිසා ජෝති ඉන්න බව දැක්කේ නෑ. සමහර අය හිතාමතාම මගහැර ගියා. සමහර දවස්වලට ජෝතිට මුදල්වත්, කෑමවත් ලැබුනේ නෑ. එයා දුක සේ ජීවත් වුණා.

එක දවසක් උදේ එතනින් පුංචි ගැහැණු ළමයෙක් එතනින් පාසල් ගියා. එයා හරිම කරුණාවන්ත , නිතරම සිනහවෙන් සිටින ගැහැණු ළමයෙක් . ඒ වගේම එයා හරිම ලස්සනයි. එයාගෙ නම "මායා". මායා නිතරම උදවු අවශ්‍ය ඕනෑම කෙනෙකුට උදවු කළා.



මායා වීදිය දිගේ ඇවිදගෙන යනකොට, වීදියේ එක කෙළවරක ජෝති හාන්සිවී සිටිනු දැක්කා. ජෝතිගේ මුහුණේ මහන්සි සහ බඩගිනි බවක් පෙනෙන්නට තිබුණා. මායා මේ හිඟන මිනිසා දුටුවා. එයා ටිකක් නැවතී ජෝතිට කතා කළා."සීයෙ, ඔයා හොඳින්ද? "ජෝතිට පුදුමයි!එයාට ළඟදි කවුරුවත් ඒ තරම් කරුණාවෙන් කතා කරලා තිබුණේ නෑ.

"මම හොඳින් චූටි දුවේ. මට ටිකක් බඩගිනියි. ඒත් කමක් නෑ. මට දැන් ඒක පුරුදුයි. අනිත් අයට මට උදවු කර කර ඉන්න වෙලාවක් නෑ".



"සීයාගෙ නම මොකක්ද ?" මායා ඇසුවා.
"මගේ නම ජෝති"."මම මායා" එයා කිව්වා.මායා ටිකක් කල්පනා කළා. මායාට අම්මා හැමදාම හදිස්සියකදී වියදම් කරන්න සල්ලි දෙනවා. එයා හැමදාම ඒ සල්ලි එකතු කළා. එහෙම කළේ අම්මාගේ ඊළඟ උපන් දිනයට තෑග්ගක් දෙන්න. ඒ සල්ලි මායාගේ බෑගයේ තිබුණා.අම්මාට තෑගගක් ගන්න තියෙන සල්ලි මේ සීයාට දුන්නොත් , මට අම්මාට තෑග්ගක් ගන්න බැරි වෙයි".

එයා හිතුවා.ඒත් එයාට ජෝති සීයාගැනත් දුකයි. අම්මා මායාට නිතරම කියන්නේ, කරුණාවන්ත හොඳ දරුවෙක් වෙන්න කියලා.ඉතින් මායා තීරණය කළා ඒ සල්ලි වලින් ටිකක් ජෝති සීයාට දෙන්න.ජෝති සීයාගේ කකුලේ තිබුණු තුවාලය නිසා එයාට වැඩි දුරක් ඇවිදින්න බෑ. ඒ නිසා මායා ළඟතිබුණු භෝජන හලකින් කෑම පාර්සලයක් ජෝති සීයාට ගෙනැවිත් දුන්නා.ඒ වගේම වතුර බෝතලයකුත් ගෙනැවිත් දෙන්න මායා අමතක කළේ නෑ.ඒ කෑම පාර්සලයේ තිබුණේ අලුත්, උණුසුම් කෑම. ජෝති සීයා කස්ලෙකින් ඒ වගේ අලුත් කෑම එකක් කාලා තිබුණේ නෑ. ජෝතිගේ ඇස් වලට කඳුලු ආවා.



බිත්තර බනිස්
බත් පාර්සල්
මාළු බනිස්
waiter
Adidas

එයාට කවුරුවත් මේ තරම් කරුණාවෙන් මින් පෙර සලකලා තිබුණේ නෑ.

"දුවේ ඔයාටත්, ඔයා වගේ කරුණාවන්ත දුවෙක් හැදූ දෙමව්පියන්ටත් ගොඩාක් පින්. මම දවස් තුනකින් හරියට කෑමක් කාලා හිටියේ නෑ. මම හිටියේ ලොකු බඩගින්නකින්. මේ උදව්ව මට කවදාවත් අමතක වෙන්නේ නෑ."

ඒ කතාව අහපු මායාට, සීයා ගැන දුකකුත්, එයා කළ යහපත් ක්‍රියාව ගැන සතුටකුත් දැනුණා.

"සීයා එහෙනම් කන්න. මම ඉස්කෝලෙ ගිහින් එන්නම්" කියමින් මායා පාසල් ගියා.

එදා පාසලේදී මායා යහලුවන්ට ජෝති සීයා ගැන කිව්වා. හෙට සෙනසුරාදා දිනයක් නිසා පාසලේ නිවාඩු. එදාට ජෝති සීයා බලන්න යන්න හැමදෙනාම කතාවුණා. ඒ වගේම එදා පාසල් අවසන් වී ගෙදර ඇවිත් මායා සිදුවූ සියලු දේ ගැන අම්මාටත් , අප්පච්චීටත් විස්තර කළා. මායාගේ කරුණාවන්ත බව දෙමව්පියෝ බොහෝ අගය කළා . " මගේ හොඳ දුව! හොඳ ළමයෙක් වගේ ලොකු වෙන එක තමයි ඔයා අපිට දෙන හොඳම තෑග්ග. "මායාගේ දෙමව්පියන් කිව්වා .

ජෝති සීයාට උදව්වක් කරන්න මායාගේ දෙමව්පියන් තීරණය කළා. ඊ ළඟ දවසේ මායා අවදිවෙනකොට, අම්මාත් , තාත්තාත් ජෝති සීයා බලන්න යන්න හැම දෙයක්ම සූදානම් කරගෙන. අම්මා කෑම හදලා. තාත්තා සීයාට ඇඳුම් ලෑස්ති කරගෙන. හැම දෙනාම සූදානම් වී ජෝති සීයා බලන්න ගියා. මායාගේ යාලුවොත් එතැනට ආවා. ලොකු පිරිසක් තමන් බලන්න පැමිණ සිටින බව දුටු ජෝති, පුදුමයටත් කලබලයටත් පත්වුණා . මායා ඉදිරියට ඇවිත් " සීයේ, මේ මගේ තාත්තා" කියලා කිව්වා. ඔහු බයෙන්, මායාගේ තාත්තාට මෙහෙම කිව්වා. "අනේ ලොකු මහත්තයෝ, මේ චූටි දුව මට ඊයේ කෑම ගෙනැත් දුන්නා. මම වරදක් කලේ නෑ. මට සමාවෙන්න". ජෝති සීයා කිව්වා.



"නෑ, නෑ ජෝති. දුව අපට හැම දෙයක්ම කිව්වා. එයා කරලා තියෙන්නේ හොඳ වැඩක්.අපි ආවේ ජෝතිට උදවු කරන්න" මායාගේ තාත්තාගේ කතාවට ජෝති සීයාට ඉබේටම ඇඬුණා.
මේ පවුලේ අයගේ කරුණාවන්තකම ගැන ජෝතිට පුදුමයි.මුලින්ම හැමෝම එකතුවෙලා ජෝති සීයාව ළඟම තිබූ පන්සලට කැඳවාගෙන ගියා.

මුලින්ම හැමෝම එකතුවෙලා ජෝති සීයාව ළඟම තිබූ පන්සලට කැඳවාගෙන ගියා. පන්සලේ හාමුදුරුවන්ට විස්තර කියූ තාත්තා මුලින්ම සීයා නාවා පිරිසිදු කළා. කොණ්ඩය සහ රැවුල කැපුවා. අලුත් ඇඳුම් ඇන්දුවා. දැන් ජෝති පාරේ හිටිය හිඟන්නෙක් කියා කාටවත්දනන්න බෑ.

දැන් හරිම පිරිසිදුයි. ගෙදරින් ගෙනා බෙහෙත්
සීයාගේ කකුලේ තුවාලයට දැම්මේ මායාගේ යාලුවෝ.
අම්මා සීයාට කෑම දුන්නා. එයා හරිම සතුටින්
පින් දෙමින් ඒ කෑම කෑවා.



ඉන් පසු පන්සලේ හාමුදුරුවෝ කරුණාවන්ත මායාටත් අනෙත් පිරිසටත් බණ කිව්වා. හැමෝම එකතුවෙලා සීයාට නවතින්න වැඩිහිටි නිවාසයක් හොයා දුන්නා. දැන් සීයාට පාරේ ඉන්න ඕනේ නෑ. එයාට ඉන්න තැනක්, කෑම බීම හැම දේම තියනවා.

මායාටත්, යාලුවන්ටත්, පවුලේ අයටත් හරිම සතුටුයි. මායාගේ කරුණාවන්තකම නිසා ජෝති සීයාට අලුත් ජීවිතයක් ලැබුණා. තමන් වැඩිහිටි නිවාසයට භාර දී ආපසු යන මායාගේ හිස අතගා ජෝති සීයා පින් දුන්නේ ඇස්වල කඳුලු පුරවාගෙන.අන් අයට කරුණාව දැක්වීම උතුම් ගුණයක්. කරුණාවන්තකමට අපි නොසිතන දේවල් කරන්න පුලුවන්.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්



978 624 208 348 3